**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 2/94(ii)**

මගේ අංකය: II/719/ඒ/302/115
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07
1995.02.07 දින

සියලුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත.

<u>ප්‍රායෝගික පුහුණු කාලය දීර්ඝ කිරීම</u>

කාර්මික විද්‍යාලවල සහ එවැනි පුහුණු ආයතනවල පාඨමාලාවල කොටසක් වශයෙන් ප්‍රායෝගික පුහුණුව සඳහා රාජ්‍ය ආයතනවලට අනුයුක්ත කර ඇති සියළුම ප්‍රායෝගික පුහුණුවන්නන්ගේ පුහුණු කාල සීමාව මාස හයකට (6) සීමා කලයුතුය.

02. මාස හයක කාලය ඉක්මවා දැනට පුහුණුවීම්වල යෙදී සිටින සියල්ලන්ගේම පුහුණු කාල සීමාව වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කල යුතුය. 1995.02.28 දින වන විට මාස හය ඉක්මවා සිටින කිසිදු පුහුණුවන්නෙකු කාර්යාලවල රැඳී නොසිටින බවට හා ගෙවීම් නොකරන බවට ආයතන ප්‍රධානීන් වගබලා ගතයුතුය.

03. අංක 2/94(i) හා 1994.06.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

අ.කලේ/(**ආර්.එස්.ජයරත්න**)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය